## සීතාවක ප්‍රාදේශීය සභාව

## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 22 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව සීතාවක ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම් වල දක්නට තිබූ ගිණුම් දෝෂ, ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වශයෙන් අවස්ථා හා අගයයන් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | ගිණුම් වලට බලපෑම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
| | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | රු. '000 | | රු. '000 | | රු. '000 | | රු. '000 |
| (අ) ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 01 | 5 | 01 | 54 | - | - | - | - |
| (ආ) ගිණුම්වලින් අත්හැරීම් | - | - | - | - | 02 | 452 | - | - |
| (ඇ) වෙනත් | - | - | - | - | - | - | 01 | 16,358 |

---

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 03 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 66,673,960 ක් වූ අතර, උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 55,064,817 ක් විය.

**1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්**

වර්ෂ 10 ක පමණ කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු. 1,129,821 ක් සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කරගෙන නොතිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු. 111,193,414 ක් වූ අතර, ඒ සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. වසර 02 ඉක්ම වූ රු. 16,300,990 ක් වූ තැන්පතු සභාවේ ආදායමට ගැනීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 20,687,666 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.19,526,771 ක් වු අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.9,684,184 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 11,274 | 11,832 | (558) |
| (ii) | බදු කුලී | 13,846 | 15,205 | (1,359) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,992 | 1,379 | (613) |
| (iv) | වෙනත් ආදායම් | 14,055 | 14,492 | (437) |

ඉදිරිපත් කර ඇති සංඛ්‍යා ගිණුම් සමඟ නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.3 අය වැය පාලනය

ඇසතමේන්තු ගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණ ඵලදායී කලමනාකරණ කාර්යයක් ලෙස යොදා ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) බැංකු ජංගම ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 12,708,798 ක් වුවද, අතිරික්ත මුදල් ශේෂය කෙටිකාලීනව හෝ ආයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) නැණසල මධ්‍යස්ථානයේ කටයුතු 2011 මැයි මාසයෙන් පසුව අක්‍රිය වී තිබූ බව 2011 දෙසැම්බර් 07 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. සිසුන් 18 දෙනෙකු පරිගණක පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. 37,950 ක් ගෙවා තිබුණ අතර, සභාව විසින් උපදේශක ගාස්තු රු. 23,400 ක් ගෙවා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 53,662,546 ක් වූ අතර, ඉන් 86% ක් රජයේ ආයතන වලින් අයවීමට තිබුණි.

(ඈ) 2003 ජුනි 02 දින හා අංක PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කල යුතු සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඉ) තැන්පත් කර වර්ෂ 05 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු. 3,329,633 ක් වූ තැන්පත් පිළිබඳ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.5 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය